## ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය - 2018

---

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, නියෝජ්‍යායතනයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ විගණන විෂය පථය යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, නියෝජ්‍යායතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය නියෝජ්‍යායතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා නියෝජ්‍යායතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

නියෝජ්‍යායතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය හා සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, නියෝජ්‍යායතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 විගණන විෂය පථය

------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස නියෝජ්‍යායතනයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් නියෝජ්‍යායතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ නියෝජ්‍යායතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ නියෝජ්‍යායතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, නියෝජ්‍යායතනය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (i) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 09 හි 47 (අ) වගන්තිය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය අවසානයට රු.1,110,839 ක් වූ තොග, අගය කිරීම සම්බන්ධ භාවිතා කළ පිරිවැය සූත්‍රයද ඇතුළුව තොග අගය කිරීමේදි යොදා ගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශන තුල හෙළිදරව් කර නොතිබුණි. | තොග අගය කිරීම බර තැබූ සාමාන්‍ය අගය මත (Weight average) සිදුකර ඇත. එම ගණනය කිරීම් වලට අදාළ ක්‍රමවේදය ගිණුම් කරන ප්‍රතිපත්ති වලට ඇතුළත් කිරීමට කටයුතු කරන බව දන්වමි. | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිමේදී ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අනුව කටයුතු කළ යුතුය. |
| (ii) වර්ෂ 3 කට අධික කාලයක සිට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ප්‍රදාන ලෙස දක්වා තිබුණු රු.349,924 ක් සමාලෝචිත වර්ෂයේදී ආදායමට ගෙන තිබුණු අතර ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 01 හි 132 වගන්තිය ප්‍රකාරව එම තොරතුරු හෙළිදරව් කර නොතිබුණි. | 2015 වර්ෂයේ සිට පුහුණු වැඩසටහන් සඳහා ලැබුණු මුදලින් ඉතිරිය ගිණුම් ප්‍රකාශනවල අරමුදල් ශිර්ෂය යටතේ තිබූ අතර එය කපා හැරීම 2018 වර්ෂයේ සිදුකරන ලදී. එය ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සටහන් කර නොතිබූ අතර එය ඇතුලත් කිරීමට කටයුතු කරන බව දන්වමි. | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඉදිරිපත් කිරිමේදී ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අනුගමනය කළ යුතුය. |

| | | |
|---|---|---|
| (iii) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 07 හි 86 (ආ) වගන්තිය ප්‍රකාරව වත්කම් සඳහා භාවිත කරන ක්ෂය ක්‍රමය හෙළිදරව් කළ යුතු වුවද නියෝජ්‍යායතනය විසින් සමාලෝචිත වර්ෂයේදී මිලදී ගෙන තිබුණු රු.179,928 ක් වූ පර්යේෂණ උපකරණ සඳහා රු. 44,982 ක් ක්ෂය කර තිබුණු නමුත් එම ක්ෂය කිරීමේ පදනම මූල්‍ය ප්‍රකාශන වල අනාවරණය කර නොතිබුණි. | පර්යේෂණ උපකරණ සියයට 25 බැගින් මිලදී ගත් වර්ෂයේ සිට ක්ෂය කිරීම සිදු කරන අතර එය ගිණුම් කරන ප්‍රතිපත්තිවලට ඇතුළත් කිරීමට කටයුතු කරන බව දන්වමි. | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඉදිරිපත් කිරීමේදී ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අනුගමනය කළ යුතුය. |

## 1.5 නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) 2013 අංක 33 දරන ක්‍රීඩාවල යෙදීමේදී උත්තේජක ද්‍රව්‍ය ලබා ගැනීමට එරෙහි සම්මුති පනතේ 33 වන වගන්තිය | උත්තේජක ද්‍රව්‍ය ලබා ගැනීමට එරෙහිව රීති සම්පාදනය කර අමාත්‍යවරයාගේ අනුමැතිය යටතේ ගැසට් පත්‍රයේ පල කර බලාත්මක කළ යුතු වුවද සමාලෝචිත වර්ෂය අවසාන වන විට නියෝජ්‍යායතනය පිහිටුවා වර්ෂ 5 ක් ගත වී තිබුණද ආයතනයෙන් අපේක්ෂා කරන ලද ප්‍රධානතම කාර්යය වූ උත්තේජක ලබා ගැනීමට එරෙහිව ක්‍රියාකිරීම සඳහා රීති සකස් කර නොතිබුණි. | තහනම් උත්තේජක නීති මාලාව නීතිපති දෙපාර්තමේන්තුවට යවා ඇති අතර නීතිපති දෙපාර්තමේන්තුවේ අදාළ නිරීක්ෂණ ලද පසු නීති මාලාව සකස් කර අවසන් කළ හැකිය. එකී නීති මාලාව මෙම වසර අවසාන වීමට පෙර ගැසට් මගින් පල කර බලාත්මක කර ගැනීමට කටයුතු කිරීමට හැකි වේ. | ආයතනයෙන් ආපේක්ෂා කරන ප්‍රධානතම කාර්ය වූ උත්තේජක ලබා ගැනීමට එරෙහිව ක්‍රියා කිරීමට අදාළ රීති සකස් කර ගැසට් පත්‍රයේ පල කර බලාත්මක කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ii) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 133 හා භාණ්ඩාගාර ලේකම්ගේ 2001 ජනවාරි 25 දිනැති අංක IAI/2001/1 දරන භාණ්ඩාගාර චක්‍රලේඛයේ 5 ඡේදය | අභ්‍යන්තර විගණන අංශයක් පිහිටුවා අභ්‍යන්තර විගණනයන් සිදු කිරීමට කටයුතු කර නොතිබුණු අතර අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශයෙන් හෝ අභ්‍යන්තර විගණනයක් සිදු කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අභ්‍යන්තර විගණන නිලධාරියෙකු බඳවා ගැනීමට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් ඉල්ලීම් කළද ඒ සඳහා අනුමැතිය නොලැබුණි. දැනට සංවර්ධන නිලධාරියෙකුට අභ්‍යන්තර විගණනය පිළිබඳ පුහුණු වීමක් ද ලබා දී ඇත. අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශයේ ප්‍රමාණවත් නිලධාරීන් නොමැති බව දන්වා ඇත. | අභ්‍යන්තර විගණකයකු බඳවා ගෙන හෝ ක්‍රීඩා අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන ඒකකය මගින් අභ්‍යන්තර විගණනයක් ක්‍රියාත්මක කළ යුතුය. |
| (iii) මුදල් රෙගුලාසි 772 | සමාලෝචිත වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණය මගින් හඳුනා ගෙන තිබුණු ප්‍රයෝජනයට ගත නොහැකි භාණ්ඩ සුදුස්සක් කොට බැහැර කිරීම සඳහා කටයුතු කර නොතිබුණි. | 2018 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ සිදුකර ඉවත් කිරීමේ ලේඛනය අමාත්‍යාංශය වෙත යොමුකර ඇත. අමාත්‍යාංශ මට්ටමින් ඉවත්කිරීම් ලේඛන, සලකා බැලූ පසු වාර්ෂික ඉවත්කිරීම් කිරීමට කටයුතු කරන බව දන්වමි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව භාණ්ඩ සමීක්ෂණය මගින් හඳුනාගත් ප්‍රයෝජනයට ගත නොහැකි භාණ්ඩ සම්බන්ධයෙන් ක්‍රියා කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 429,424 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 29,800 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 399,624 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට භාණ්ඩාගාර ප්‍රදාන රු.24,971,170 කින් වැඩිවීම සහ අනෙකුත් ආදායම් රු.2,108,632 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 අනුපාත විශ්ලේෂණය

ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී නියෝජ්‍යායතනයේ ජංගම වත්කම් අනුපාතය 1.39 සිට 0.24 දක්වා අඩු වී තිබුණි. ඒ අනුව නියෝජ්‍යායතනයේ කෙටිකාලීන බැරකම් පියවීමේ හැකියාව ඉකුත් වර්ෂයට සාපේක්ෂව පිරිහී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ ක්‍රියාකාරකම්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **(i) මානව තහනම් උත්තේජක පරීක්ෂාව** | | |
| නියෝජ්‍යායතනය විසින් මානව තහනම් උත්තේජක සම්බන්ධ පරීක්ෂා කිරීම් සමාලෝචිත වර්ෂයේදී 276 ක් සහ ඉකුත් වර්ෂයේදී 134 ක් සිදුකර තිබුණි. ඒ අනුව ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී පරීක්ෂා කිරීම් 142 කින් වර්ධනය වී තිබුණි. සමාලෝචිත වර්ෂයේදී තහනම් උත්තේජක ගැනීම් අවස්ථා 06 ක් හා ඉකුත් වර්ෂයේදී 05 ක් සනාථ වී තිබුණි. තවද ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව යටතේ ලියාපදිංචි ජාතික ක්‍රීඩා 62 ක් පැවති අතර, සමාලෝචිත වර්ෂයේදී ජාතික ක්‍රීඩා 17 කට අදාළව හා 2017 වර්ෂයේදී ජාතික ක්‍රීඩා 09 කට අදාළව පමණක් මෙම පරීක්ෂණ සිදුකර තිබුණි. | 2018 වර්ෂය සඳහා තහනම් උත්තේජක පරීක්ෂණ 276 ක් සිදු කිරීමට සැලසුම් කරන ලදී. ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් ලියාපදිංචි ක්‍රීඩා 62 ක් පැවතියද 2017 වර්ෂයේ දී හා සමාලෝචිත වර්ෂයේ සිදුකළ Risk Assessment මගින් තෝරා ගත් තහනම් උත්තේජක පරීක්ෂණ 2018 වර්ෂයේදී සිදුකළ අතර මේ සඳහා ලබා දුන් ප්‍රතිපාදන අනුව කළ හැකි පරීක්ෂණ අප විසින් කරන ලදී. සෑම තරඟයකම තහනම් උත්තේජක පරීක්ෂණ සිදුකළ නොහැකි අතර Risk Assessment අනුව තහනම් උත්තේජක පරීක්ෂණ සිදුකරන ලදී. | වැඩි තරඟ ප්‍රමාණයක් හා සියලුම ක්‍රීඩා ආවරණය වන පරිදි නියැදියක් තෝරා ගෙන තහනම් උත්තේජක පරීක්ෂා කිරීම කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය. |
| **(ii) සත්ත්ව තහනම් උත්තේජක පරීක්ෂාව** | | |
| සත්ත්ව උත්තේජක පරීක්ෂා කිරීම් ගණන සමාලෝචිත වර්ෂයේදී 09 ක් හා ඉකුත් වර්ෂයේදී 07 ක් වී තිබූ අතර වර්ෂ දෙකේදීම සත්වයින්ට උත්තේජක දීම් කිසිවක් සනාථ වී නොතිබුණි. | උත්තේජක පරීක්ෂණ සඳහා වාර්ෂිකව රු.මිලියන 13 පමණ වැය වන බැවින් අත්‍යාවශයෙන්ම ගැනෙන ක්‍රීඩා අනුව පරීක්ෂණ සිදු කරන ලදී. නමුත් 2019 වර්ෂයේදී, පෙර වර්ෂයට වඩා වැඩි ක්‍රීඩා ප්‍රමාණයක් ආවරණය කිරීමට සැලසුම් කර ඇති බව දන්වමි. | වැඩි තරඟ ප්‍රමාණයන් ආවරණය වන පරිදි සත්ත්ව තහනම් උත්තේජක පරීක්ෂා කිරීම කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය. |

**(iii) සම්මන්ත්‍රණ හා වැඩමුළු පැවැත්වීම**

---------------------------

පාසැල් ශිෂ්‍යයන්, ක්‍රීඩා නිලධාරීන්, භෞතික චිකිත්සක පුහුණුකරුවන්, ක්‍රීඩා පුහුණුකරුවන්, ක්‍රීඩක ක්‍රීඩිකාවන් සහ දෙමව්පියන්, ක්‍රීඩා සම්භාහකයින් යන පිරිස් සඳහා ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ යුතුකම් හා වගකීම්, තහනම් උත්තේජක භාවිතයේ අහිතකර ප්‍රතිවිපාක, මත්ද්‍රව්‍ය පාලනය කිරීමේ ක්‍රියාවලිය, අවශ්‍ය තොරතුරු ලබා ගන්නා ක්‍රමවේද, තහනම් උත්තේජක භාවිතය වළක්වා ගැනීමේ චිකිත්සක ක්‍රමවේදය, ලෝක මත්ද්‍රව්‍ය විරෝධතා වැඩසටහන පිළිබඳ මූලික අවබෝධය යන කරුණු කෙරෙහි අවධානය යොමු කරමින් සම්මන්ත්‍රණ හා දැනුවත් කිරීමේ වැඩසටහන් 72 ක් සමාලෝචිත වර්ෂයේදී පවත්වා තිබුණු අතර ඊට සහභාගිවූ පිරිස 2,268 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ වැඩසටහන් 51 ක් සඳහා සහභාගිවූ පිරිස 3,581 ක් විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී වැඩසටහන් පැවැත්වීමේ ප්‍රමාණය 21 කින් වැඩි වී තිබුණද ඒ සඳහා සහභාගිවූවන්ගේ සංඛ්‍යාව 1,313 කින් අඩු වී තිබුණි.

2018 වර්ෂයේ මුල් කාලයේ තහනම් උත්තේජක පිළිබඳව දැනුවත් කිරීමේ වැඩමුළු පැවැත්වීම සඳහා ප්‍රධාන වශයෙන් ඉලක්ක ගත කරනු ලැබුවේ 2018 වර්ෂයේ ආසියානු ක්‍රීඩා සඳහා සහභාගී වන ක්‍රීඩක ක්‍රීඩාවන්ය.
නමුත් ආසියානු ක්‍රීඩා සංචිතයන් ක්‍රීඩක ක්‍රීඩිකාවන් සුළු ප්‍රමාණයකින් සමන්විත වන බැවින් 2018 වර්ෂයේ දැනුවත් කිරීමේ වැඩමුළු සඳහා සහභාගී වූ ප්‍රමාණය ඉකුත් වර්ෂයට සාපේක්ෂව අඩු අගයක් ගනී.

ක්‍රීඩක ක්‍රීඩිකාවන් ආවරණය වන පරිදි තහනම් උත්තේජක පිළිබඳ සම්මන්ත්‍රණ හා වැඩමුළු වැඩි ප්‍රමාණයක් පැවැත්වීම කෙරෙහි කළමනාකාරීත්වයේ විශේෂ අවධානය යොමු විය යුතු අතර වැඩමුළු පැවැත්වීමේදී නොපැමිණෙන ක්‍රීඩකයින් සම්බන්ධයෙන් පසු විපරම් කිරීම් ක්‍රියාවලියක් ක්‍රියාත්මක කළ යුතුය.

## 3.2 ව්‍යාපෘති හෝ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්

නියෝජ්‍යායතනයේ නව ගොඩනැගිල්ල ඉදිකිරීම, එහි අභ්‍යන්තර සැලසුම් හා ලී බඩු උපකරණ මිලදී ගැනීම වෙනුවෙන් රු.මිලියන 230.83 ක පිරිවැය ඇස්තමේන්තු සකස් කර තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් රු.මිලියන 189.1 ක් වැයකර තිබුණි. 2016 වර්ෂයේදී ආරම්භ කළ මෙම ව්‍යාපෘතිය සමාලෝචිත වර්ෂයේ මැද භාගයේදී අවසන් කිරීමට නියමිතව තිබුණද එය අවසන් කර තිබුණේ සමාලෝචිත වර්ෂයේ අගභාගයේදීය.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (i) මූලික ඇස්තමේන්තුව සකස් කිරීමේදී හඳුනා ගත හැකිව තිබුණු ගොඩනැගිල්ලේ සිවිලිම ඉදිකිරීම, විදුලි ජනක යන්ත්‍ර හා වායු සමීකරණ පද්ධතියන් සැපයීම හා සවි කිරීම, විදුලිය ලබා ගැනීමේ කටයුතු, ගොඩනැගිල්ලේ කාමර වෙන් කිරීමේ කටයුතු හා ජල සැපයුම් කටයුතු මූලික ඇස්තමේන්තුවට ඇතුළත් නොකිරීම හේතුවෙන් ගොඩනැගිල්ල සඳහා අත්‍යවශ්‍ය වූ විෂයයන් 19 ක් සඳහා අමතර ඇස්තමේන්තුවක් සකසා එම කටයුතු මුල් කොන්ත්‍රාත්කරු වෙත පවරා තිබුණි. ඒ අනුව මුල් කොන්ත්‍රාත්තුව පිරිනැමීමේදී සියලුම විෂයයන් ඇතුළත් කර ලංසු කැඳවා නොතිබීම හේතුවෙන් වඩාත් වාසිදායක තරඟකාරී මිලකට කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමේ අවස්ථාව මඟහැරී තිබුණු බව නිරීක්ෂණය විය. | ඉදිකිරීම් සිදු කරන අවස්ථාවේ විචලතා 13 ක සහ අමතර වැඩ 06 ක් හඳුනා ගන්නා ලදී. ඒ අනුව අමතර වැඩ ලෙස ඇතුලත් වී ඇත්තේ අයිතම 06 ක් වන අතර එහි පිරිවැය රු.මිලියන 48.8 කි. ඉදිකිරීම් කටයුතු සැලකිය යුතු ප්‍රමාණයක් අවසන්ව පවතින බැවින් කඩිනමින් ඉදිකිරීම් අවසන් කිරීම සඳහා එම කටයුතු ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.13.4 යටතේ එම කොන්ත්‍රාත්කරුට පැවරීමට කටයුතු කරන ලදී. | ව්‍යාපෘතින් ඇරඹීමට ප්‍රථම සියලුම ඉදිකිරීම් ආවරණය වන පරිදි විස්තරාත්මක පිරිවැය විග්‍රහයන් ඇතුළත් වන පරිදි ඇස්තමේන්තුවක් පිළියෙල කළ යුතු අතර ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන පරිදි විධිමත් සැලසුමකට අනුව ප්‍රසම්පාදන කටයුතු ක්‍රියාත්මක කළ යුතුය. |
| (ii) විදුලිබල සම්බන්ධතාවය ලබා ගැනීමට ප්‍රමාද වීම සහ මළ හා අපජල සම්බන්ධතාව ලබා ගැනීමට ප්‍රමාද වීම මෙම ව්‍යාපෘතිය නිසි වේලාවට නිම නොකිරීමට හේතුවී තිබුණි. | අප ආයතනයට විදුලි බල සම්බන්ධතා ලබා දෙන 95 KV කේබල් මේ වන විටත් විදුලිබල මණ්ඩලයේ නොමැති අතර ඊට අදාළ ප්‍රසම්පාදන කටයුතු සිදු කරමින් පවතින බව විදුලිබල මණ්ඩලය පවසා ඇත. එබැවින් තාවකාලිකව විදුලිබල සම්බන්ධකමක් ලබා ගෙන විදුලිය ලබා ගෙන ඇත. | ව්‍යාපෘති ඇරඹීමට ප්‍රථම විස්තරාත්මක වැඩ හා පිරිවැය විග්‍රහයන් අඩංගු වන පරිදි ඇස්තමේන්තුවක් පිළියෙල කළ යුතු අතර විධිමත් සැලසුමකට අනුව ප්‍රසම්පාදන කටයුතු ක්‍රියාත්මක කළ යුතුය. |

| | | |
|---|---|---|
| | එසේම මල/ අප ජල සම්බන්ධව ප්‍රධාන පද්ධතියට සම්බන්ධ කිරීමට අදාළ ඉදිකිරීම් කටයුතු කොළඹ නගර සභාව මගින් සිදු කර ගත යුතු අතර එයට අදාළ ප්‍රසම්පාදන කටයුතු නගර සභාව මගින් සිදු කරමින් පවතී. එබැවින් තාවකාලික මල/ අප ජල ඉවත් කිරීමේ පද්ධතිය සවි කරන ලදී. | |

**3.3 මානව සම්පත් කළමනාකරණය**

-----------------------------------

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| 2015 වර්ෂයේ සිට පුරප්පාඩුවී පැවති අධ්‍යක්ෂ තනතුරක්, සහකාර අධ්‍යක්ෂක තනතුරු දෙකක් හා රියදුරු තනතුරක් පිරවීම සඳහා නියෝජ්‍යායතනය විසින් සමාලෝචිත වර්ෂය තුලදී කටයුතු කර නොතිබුණි. | සුදුසුකම් වලින් යුතුව සංශෝධිත බඳවා ගැනිමේ පරිපාටි අනුමැතිය සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කොට ඇත.<br>එම දෙපාර්තමේන්තුව විසින් මේ වන විට බඳවා ගැනීමේ පරිපාටි විශ්ලේෂණය කර අවසන් අදියරයන්හි පවතී. එය අනුමත වූ වහාම අදාළ බඳවා ගැනීමේ කටයුතු කිරීමට නියමිතයි. | අනුමත කාර්ය මණ්ඩලය බඳවා ගැනීමට අප්‍රමාදව කටයුතු කළ යුතුය. |

**4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

-----------------------------------------

**4.1 අයවැය පාලනය**

--------------------

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| අයවැයගත සංඛ්‍යා තත්‍ය සංඛ්‍යා සමග සැසඳීමේදී විෂයයන් 17 කට අදාළව සියයට 10 සිට සියයට 97 දක්වා විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය. | 2018 වර්ෂය තුළ අනුමත වූ අයවැය ප්‍රතිපාදන මාසික අවශ්‍යතාව අනුව භාණ්ඩාගාරයෙන් ඉල්ලුම් කළද භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව මගින් ප්‍රමාණවත් ප්‍රතිපාදන ලබා දීම සිදු නොකරන ලදී. එබැවින් සැලසුම් කළ පරිදි සංවර්ධන කටයුතු සිදු කර ගැනීමට නොහැකි විය. 2019 වර්ෂයේ එවැනි දුර්වලතා මඟ හරවා ගැනීමට කටයුතු කරන බව දන්වමි. | අයවැය ඇස්තමේන්තු නිවැරදිව පිළියෙල කර පාලන කාරකයන් ලෙස යොදා ගත යුතු අතර විචලනයන් පිළිබඳව කාලීනව සැලකිල්ලට ගත යුතුය. |